# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/10 - 2023 අගෝස්තු මස 14 වැනි සඳුදා - 2023.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත (සංශෝධිත)**

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතෙහි 54(1) සහ 54(2) වගන්තීන් මගින් මා හට ලැබී ඇති බලතල ප්‍රකාරව, වාරිමාර්ග අමාත්‍ය රොෂාන් රණසිංහ වන මා විසින් මෙම පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්යය සඳහා සාදනු ලබන නියෝග මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර මෙම නියෝග *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**රොෂාන් රණසිංහ,**
වාරිමාර්ග අමාත්‍ය.

2023 අගෝස්තු මස 08 වැනි දින,
වාරිමාර්ග අමාත්‍යාංශය.

මෙම පනතේ සඳහන් කාර්යයන්, අරමුණු, ප්‍රතිපත්ති සහ බලතල යන විධිවිධානයන් විමර්ශනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම සඳහා පහත සඳහන් විද්වත් උපදේශන කමිටුවක් මෙයින් පත් කරනු ලැබේ;

1) විෂය පිළිබඳ දැනුමක් ඇති දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් දෙදෙනකු (විශ්‍රාමික)
2) ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ දැනුමක් ඇති විශ්ව විද්‍යාල ආචාර්යවරයකු
3) මූල්‍ය විෂය පිළිබඳ විශේෂ දැනුමක් ඇති නිලධාරියකු
4) විෂය පිළිබඳ දැනුමක් ඇති ඉංජිනේරුවරයකු
5) නීති ක්ෂේත්‍රයේ පළපුරුදු නීතිඥවරයකු.

EOG 08 - 0135

1A - PG 6443 — 366 (2023/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*